කැළණිය විශ්ව විද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යයන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදි (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර)- 2012

2015 පෙබරවාරි

## BCOME 2045 - උසස් මූල්‍ය ගිණුම්කරණය

ප්‍රශ්න සංඛ්‍යාව : 05

කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

ප්‍රශ්න අංක 01

2014 මාර්තු 31 දින සීමිත නවලෝක සමාගමේ පොත් වලින් පහත ශේෂ උපුටා ගන්නා ලදී.

| | රු. 000' හර | රු. 000' බැර |
|---|---|---|
| සාමාන්‍ය කොටස් ප්‍රකාශිත ප්‍රාග්ධනය (කොටස් 5,000,000) | | 50,000 |
| 10%, වරණිය කොටස් ප්‍රකාශිත ප්‍රාග්ධනය (100,000) | | 1,000 |
| පොදු සංචිත | | 10,000 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 5,000 |
| 2013.04.01 දිනට ලාභ සහ අලාභ ගිණුම | 400 | |
| 14 %, රු. 100 ණයකර | | 500 |
| ණයකර පොළී | 60 | |
| විකුණුම් | | 25,620 |
| ගැණුම් | 10,520 | |
| ආරම්භක තොග | 140 | |
| 2013/03/31 දිනට දේපළ, පිරියත හා උපකරණ | | |
| ඉඩම් පිරිවැය - පිරිවැය | 45,000 | |
| ගොඩනැගිලි -පිරිවැය | 17,000 | |
| මෝටර් වාහන - පිරිවැය | 4,000 | |
| ලීබඩු සහ සවිකිරීම් - පිරිවැය | 420 | |
| 2013/04/01 දිනට සමුච්චිත ක්ෂය | | |
| ගොඩනැගිලි | | 5,230 |
| මෝටර් වාහන | | 520 |
| ලී බඩු - සහ සවිකිරීම් | | 43 |
| 2013/10/01 දිනට ගෙවූ අතුරු ලාභාංශ - සා/කො | 2,700 | |
| වා/කො | 45 | |
| වැටුප් හා වේතන | 1,550 | |

| | | |
|---|---|---|
| දුරකථන හා විදුලිය | 570 | |
| විගණන ගාස්තු | 370 | |
| 2013.04.01 දිනට අඩමාන ණය සඳහා වෙන් කිරීම් | | 125 |
| ප්‍රචාරණ වියදම් | 568 | |
| ණයගැතියෝ සහ ණයහිමියෝ | 1,000 | 830 |
| බැංකු ණය - පොළී 20 % (2013.10.01 ලබාගත්) | | 1,200 |
| බැංකු ණය පොළී | 60 | |
| ගෙවූ බදු | 190 | |
| මුදල් හා බැංකු | 430 | |
| වෙනත් විකුණුම් වියදම් | 45 | |
| ආයෝජන (පොළී 10 %) | 15,000 | |
| | 100,068 | 100,068 |

අතිරේක තොරතුරු සපයා ඇත.

1. අවසාන තොගයෙහි පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි අගය පිළිවෙලින් රු. 155,000 ක් සහ රු. 145,000 ක් ලෙස ඇස්තමේන්තුගත කර ඇත.
2. 2013 මාර්තු මස වැටුප් රු. 20,000 නොගෙවා ඇති අතර ඒ සඳහා සැපයීම් සිදු කළ යුතු වේ. කෙසේ වෙතත්, කළින් ගෙවූ රු. 15,000 ක අත්තිකාරම් වැටුප් තුළ ඇතුළත් වේ.
3. පිරිවැය රු. 104,000 ක් වූ නව ලී බඩු වල කොටසක් පියවීම සඳහා 2011 අප්‍රේල් 01 දින රු. 120,000 කට මිලදී ගත් ලී බඩු 2013 ජූනි 30 දින රු. 58,000 කට විකුණන ලදී. රු. 46,000 ක ශුද්ධ වටිනාකම වැරදීමකින් ගැණුම් පොතේ වාර්තාගත කර ඇත. මෙම ගනුදෙනුව සම්බන්ධයෙන් වෙනත් කිසිදු සටහනක් තබා නැත.
4. ඉඩම් රු. 55,000,000 කට ප්‍රත්‍යාගණනය කරන ලදී.
5. දේපළ, පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමය යටතේ පහත පරිදි ක්ෂය වේ.
6. බැංකු ණය 2014 ජූලි සිට මාසික වාරික 40 කින් ගෙවිය යුතු වේ.
7. ප්‍රවර්තන වර්ෂයේ බදු වගකීම රු. 240,000 කි.
8. අඩමාන ණය සඳහා වෙන් කිරීම 10 % කි.
9. අධ්‍යක්ෂකවරුන් පහත වෙන් කිරීම් යෝජනා කර ඇත.

    රු. 25,000 ක් පොදු සංචිතයට මාරු කිරීම

    සාමාන්‍ය කොටස් සඳහා රු. 1 ක ලාභාංශයක් සහ වරණීය කොටස් සඳහා ඉතිරි ලාභාංශ යෝජනා කිරීම.

2014 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා ප්‍රසිද්ධ කිරීමට පහත මූල්‍යප්‍රකාශන සංරචක පිළියෙල කළ යුතු වේ.

අ. විස්තීරණ ආදායම් ප්‍රකාශනය

ආ. මූල්‍ය තත්ව ප්‍රකාශනය

ඇ. හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

ඉ. දේපළ, පිරියත හා උපකරණ වෙනස්වීමේ ප්‍රකාශනය (මුළු ලකුණු 40 යි)

ප්‍රශ්න අංක 02

ජයසිරි සමාගමේ 2014 සහ 2013 මූල්‍ය තත්ව ප්‍රකාශන සමඟ 2014 මාර්තු 31 න් අවසන් වර්ෂයට අදාළ සංක්ෂිප්ත මූල්‍ය ප්‍රකාශන පහත පරිදි වේ.

2014 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා

ආදායම් ප්‍රකාශනය (රු. 000 ' )

| | |
|---|---|
| විකුණුම් | 7,230 |
| විකුණුම් පිරිවැය | 4,530 |
| දළ ලාභය | 2,700 |
| පරිපාලන සහ විකුණුම් වියදම් | 1,630 |
| බදු පෙර ශුද්ධ ලාභය | 1,070 |
| ආදායම් බදු වියදම් | 320 |
| බදු පසු ශුද්ධ ලාභය | 750 |

මූල්‍ය තත්ව ප්‍රකාශනයන්

| | 2014/03/31 ට | 2013/03/31 ට |
|---|---|---|
| වත්කම් | | |
| ජංගම නොවන වත්කම් | | |
| දේපළ, පිරියත හා උපකරණ | 5,810 | 4,800 |
| (-) සමුච්චිත ක්ෂය | (3,180) | (2,940) |
| ජගම වත්කම් | | |
| තොග | 540 | 580 |
| වෙළඳ ණයගැතියෝ | 770 | 800 |
| මුදල් | 420 | 360 |
| මුළු වත්කම් | 4,360 | 3,600 |
| හිමිකම හා වගකීම් | | |
| හිමිකම | | |
| සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය | 610 | 600 |
| රඳවාගත් ලාභ | 590 | 20 |
| ජංගම නොවන වගකීම් | | |
| බැංකු ණය | 2,930 | 2,700 |
| ජංගම වගකීම් | | |
| වෙළඳ ණය හිමියෝ | 230 | 280 |
| | 4360 | 3600 |

ඉහත තොරතුරු ආශ්‍රයෙන් 2014 මාර්තු 31 න් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කරන්න.

(මුළු ලකුණු 25 යි)

ප්‍රශ්න අංක 03

Q හි රඳවාගත් ඉපැයුම් රු. 110,000ක් වන විට සීමිත P සීමිත Q හි ශුද්ධ වත්කම් වලින් 100 % 2007.12.15 දින අත්පත් කර ගන්නා ලදී. 2014.03.31 දිනට සමාගම් දෙකෙහි මූල්‍ය තත්ව ප්‍රකාශනයන් පහත පරිදි විය.

| | සීමිත P (රු.) | සීමිත Q (රු.) |
|---|---|---|
| ජංගම නොවන වත්කම් | 510,000 | 423,000 |
| ආයෝජන | 5000,000 | |
| ජංගම වත්කම් | 273,000 | 164,000 |
| | 1,283,000 | 587,000 |
| **හිමිකම** | | |
| සාමාන්‍ය කොටස් ප්‍රකාශිත ප්‍රාග්ධනය | 800,000 | 150,000 |
| රඳවාගත් ඉපැයුම් | 282,000 | 410,000 |
| | 1082,000 | 560,000 |
| **වගකීම්** | 201,000 | 27,000 |
| | 1,283,000 | 587,000 |

අතිරේක තොරතුරු

1. කීර්තිනාමය 20 % කින් හානිකරණය විය යුතු බවට ඇස්තමේන්තු ගත කර ඇත.
2. 20 % ක ආන්තිකයකට සීමිත P වර්ෂය තුළ සීමිත Q ට භාණ්ඩ විකුණා ඇත. සීමිත P ට එහි පිරිවැය රු. 25,000 ක් විය. භාණ්ඩ වලින් 15 % ක් සීමිත Q හි තොගයේ ඉතිරිව ඇත.
3. වර්ෂය තුල සීමිත Q රු. 30,000 ට ඉන්වොයිස් කළ මිලට ( 25 % ක ආන්තිකයකට ) සීමිත P ට භාණ්ඩ විකුණන ලදී. 25 % ක භාණ්ඩ තවමත් විකුණා නැත.

ඔබ විසින් 2014.03.31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය පිළියෙල කළ යුතු වේ.

(මුළු ලකුණු 20 යි)

ප්‍රශ්න අංක 04

අරවින්ද සමාගම රු. 10 බැගින් සාමාන්‍ය කොටස් 100,000 ක් නිකුත් කරන ලදී. ගෙවීම් පහත පරිදි විය.

අයදුමේදී රු. 50

විභජනයේදී රු. 30

ඇරයුමේදී රු. 20

2013.08.01 -කොටස් 100,000 ක් සඳහා අයඳුම්පත් ලද අතර සියළුම කොටස් විභජනය කිරීමට තීරණය කරන ලදී.

2013.08.01 - විභජනය සිදු කරන ලදී.

2013.08.20 - කොටස් හිමියන් විසින් විභජන මුදල් සම්පූර්ණයෙන්ම ගෙවන ලදී.

2013.08.30 - ඇරයුම් මුදල් කැඳවන ලද අතර එය 2013.09.15 ට පෙර ගෙවිය යුතු බවට දන්වන ලදී.

2013.09.15 - කොටස් 10,000 කට හැර ඉතිරියට ඇරයුම් මුදල් සම්පූර්ණයෙන්ම ලැබිණි. සමාගම ඔවුන්ගේ සාංගමික ව්‍යවස්ථාවේ දක්වෙන පරිදි හිග මුදල් සඳහා 10 % ක පොළියක් අය කිරීමට තීරණය කරන ලදී.

2013.09.30 - ඇරයුම් මුදල් හිග කොටස් හිමියන්ට ඔවුන්ගේ කොටස් නැවත විකුණන බවට සමාගම දැනුම් දෙන ලදී.

2013.10.15 - රු. 30,000 ක වියදම් දරමින් සමාගම කොටස් එකක් රු. 80 බැගින් නැවත විකුණන ලදී. අවසානයේ ඉතිරි මුදල් සමාගම පෙර කොටස් හිමියන්ට ගෙවන ලදී.

ඉහත ගනුදෙනු වාර්තා කිරීමට අවශ්‍ය ජනල් සටහන් දෙන්න. (මුදල් ද ඇතුළුව )

(මුළු ලකුණු 10 යි)

ප්‍රශ්න අංක 05

මූල්‍ය ප්‍රකාශන වල ඉදිරිපත් කළ යුතු ගුණාත්මක ලක්ෂණ 4 ක් පැහැදිලි කරන්න.

(මුළු ලකුණු 05 යි)